# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,477 — 1965 අගෝස්තු 10 වැනි අඟහරුවාද — 1965.8.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ජෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්‍ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### 12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1963 වර්‍ෂයේ ඔක්තෝබර් මාසයේ 9 වෙනි දින අංක 13,785 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් සංශෝධිත පරිදි, 1962 වර්‍ෂයේ අගෝස්තු මාසයේ 10 වෙනි දින අංක 13,258 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද ගා/බටපොල බෞද්ධ සිංහල මිශ්‍ර පාසලට අයත් සියළුම දේපොල රජය වෙනුවෙන් භාර ගැනීමට අම්බලම්ගොඩ පාඨශාලා පරීක්ෂක තැන්පත් හේවා පොන්සේකාගේ ලෙන්ට් පොන්සේකා මහතාට මෙයින් බලය පවරමි.

2. එකී හේවා පොන්සේකාගේ ලෙන්ට් පොන්සේකා මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපොල භාර ගැනීම වැලැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දැක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවෙක් වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වන වගන්තිය යටතේ දඬුවමට භාජන කරණු ලැබිය හැකිද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජාපාඅච/154/සාපා.
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ වීදිය, කොළඹ 2,
1965 ක්වූ ජූලි මස 31 වෙනි දින දීය.

8-430/1

### 1961 වර්‍ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

අම්බලම්ගොඩ පාඨශාලා පරීක්ෂක තැන්පත් හේවා පොන්සේකාගේ ලෙන්ට් පොන්සේකා වන මම, 1963 වර්‍ෂයේ ඔක්තෝබර් මාසයේ 9 වෙනි දින අංක 13,785 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් සංශෝධිත පරිදි, 1962 වර්‍ෂයේ අගෝස්තු මාසයේ 10 වෙනි දින අංක 13,258 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද ගා/බටපොල බෞද්ධ සිංහල මිශ්‍ර පාසලට අයත් දේපොල 1965 වර්‍ෂයේ අගෝස්තු මාසයේ 31 වෙනිදා පෙරවරු 9 ට එකී ගා/බටපොල බෞද්ධ සිංහල මිශ්‍ර පාසලේදී රජය සඳහාද, වෙනුවෙන්ද භාරගැනීමට අදහස් කරන බව එම පාසලේ දේපොල ගැන අයිතිවාසිකම් ඇති සියළු දෙනා වෙතම මෙයින් දැනුම් දෙමි.

2. එම දේපොලට අයිතිවාසිකම් ඇති සියළු දෙනාම නැතහොත් ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් මෙහි (1) වන ඡේදයෙහි සඳහන්වූ දිනයෙහි නියම වේලාවට එකී ස්ථානය වෙත පැමිණ එම දේපොල රජය සඳහාද, වෙනුවෙන්ද භාර ගැනීමට මට ඉඩදෙන ලෙසත් සහාය වන ලෙසත්, මෙයින් නියෝග කරමි.

එච්. එල්. පොන්සේකා,
පාඨශාලා පරීක්ෂක.

1965 ජූලි මස 31 වැනි දින,
අම්බලම්ගොඩ දීය.

8-430/2


ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි

1203 —— ආර් 7974—6,300 (65/8)